අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +941 12785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/58/20/ජාතිකපාසල්-SLPS
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2023.

නම
සම්මුඛ පරීක්ෂණ අංකය

**ජාතික පාසල්වල පුරප්පාඩු වී ඇති විදුහල්පති තනතුරු සඳහා නිලධාරීන් තෝරා පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම - ශ්‍රී ලංකා විදුහල්පති සේවය I**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි දිවයින පුරා පිහිටි ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ නිළධාරියෙකු විදුහල්පති ධූරය දැරිය යුතු ජාතික පාසල් 74 ක විදුහල්පති තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබ කැඳවනු ලබන බව සතුටින් දන්වා සිටිමි.

02 ඒ සඳහා ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ 4 වන මහල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාවට අයත් රැස්වීම් ශාලාවට.......................... දින පෙ.ව./ප.ව. ........................ට පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි. එදිනට පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් හා ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද අදාළ සහතිකවල ඡායා පිටපත් (අංක I සිට VII දක්වා ලේඛන) ගොනුවක් පහත සඳහන් අනුපිළිවෙලට සකස් කර ඔබගේ නම හා සම්මුඛ පරීක්ෂණ අංකය ද සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

I. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපිය
II. ජාතික හැඳුනුම්පත
III. නමෙහි වෙනසක් පවතී නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශය (නමෙහි වෙනසක් පවතී නම් පමණක්)
IV. සේවා පළපුරුද්ද සනාථ කිරීම සඳහා
   a) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියට උසස්වීම් ලිපිය /අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය / පත්වීමේ ලිපිය (උසස්වීම් ලිපිය ලබා නොමැති නම් ඒ සඳහා සියලුම සුදුසුකම් සපුරා ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව)
   b) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියට පත් වූ දින සිට 2023.07.31 දින දක්වා ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන සේවය පිළිබඳ සහතිකය - ආකෘති පත්‍ර අංක 01
V. අධ්‍යාපන සුදුසුකම් - (ලකුණු පටිපාටියේ අනු අංක 02 ට අදාලව)
VI. සේවා ඇගයීම - (ලකුණු පටිපාටියේ අනු අංක 05 ට අදාලව)
VII. අධ්‍යාපනයට අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන - (ලකුණු පටිපාටියේ අනු අංක 06 ට අදාලව)
   a) ලකුණු පටිපාටියේ අංක 6 යටතේ ඔබ විසින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අධ්‍යාපන පර්යේෂණ හා ප්‍රකාශනවල සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කිරීමේ දී එම පර්යේෂණය/ප්‍රකාශනය කුමක්ද යන්න පැහැදිලිව දක්වා ඇති පිටුව/පිටු, එම ප්‍රකාශනවල කතෘ/ප්‍රකාශක ලෙස ඔබගේ නම සඳහන් වන පිටුව/පිටු වල ආයතන ප්‍රධානී සහතික කරන ලද පිටපත් සමඟ අදාළ පර්යේෂණ හා ප්‍රකාශනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

03. ලකුණු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනයන්හි දකුණු පස ඉහළ කෙළවර ලකුණු පටිපාටියේ කුමන අනු අංකය යටතේ ලකුණු ලබා ගැනීමට ඉදිරිපත් කරන්නේ ද යන්න සඳහන් කර තිබිය යුතුය.

උදා - අධ්‍යාපන සුදුසුකම් සඳහා ඉදිරිපත් කරනු ලබන සහතික - අනු අංක 02

ඒ අනුව ඡායා පිටපත් ගොනුව සැකසීමෙන් පසු මේ සමග අමුණා ඇති ආකෘති පත්‍ර අංක 02 සම්පූර්ණ කර ගොනුව සමග සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රසිද්ධ කර ඇති ලකුණු පටිපාටියේ දක්වා ඇති 'සටහන්' කෙරෙහි මනා අවධානයෙන් යුක්තව ලේඛන ඉදිරිපත් කළ යුතුය.

04. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී ඔබ දක්වනු ලබන කාර්ය සාධනය හා ඔබගේ අධ්‍යාපන සුදුසුකම් අනුව උපයාගනු ලබන ලකුණු මත ලබා ගන්නා සමස්ත කුසලතාවයේ ප්‍රමුඛතාවය අනුව පමණක් විදුහල්පති තනතුරු පුරප්පාඩු වී ඇති ජාතික පාසලක විදුහල්පති තනතුරකට පත් කරනු ලැබීම සිදු වේ.

05. අයදුම්කරුවන් අදාළ අයදුම්පත්‍රයේ මනාපය පළකරන ලද ඕනෑම ජාතික පාසලක විදුහල්පති තනතුරකට පත්වීම් ලදහොත් අනිවාර්යයෙන්ම එම තනතුරෙහි රාජකාරී භාරගත යුතු බවත්, පසුව අයදුම්පත්‍රයේ මනාපය වෙනස් කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා නොලබන බවත්, වැඩිදුරටත් දන්වමි.

06. සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පමණක් පුරප්පාඩු වී ඇති ජාතික පාසලක විදුහල්පති තනතුරක් ලබා ගැනීම සඳහා හිමිකමක් නොවන බවද, දැනට පුරප්පාඩු වී ඇති ජාතික පාසල් විදුහල්පති තනතුරු සියල්ල සඳහාම නිලධාරීන් පත් කිරීමේ හෝ තනතුරු කිහිපයක් සඳහා පමණක් නිලධාරීන් පත් කිරීමේ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව සතු වන බව ද, වැඩිදුරටත් අවධාරණය කරමි.

| | |
|---|---|
| | අ.කළේ :- එම්.එන්.රණසිංහ |
| ආචාර්ය අයි.එම්.කේ.බී.ඉලංගසිංහ | ලේකම් |
| අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) | අධ්‍යාපන අමාත්‍යාංශය |

අවධානයට: ඔබ නියමිත දින සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම අනිවාර්යය බව ද සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමේදී ඉහත සඳහන් ලිපි ලේඛන සියල්ලම නිවැරදි ලෙස රැගෙන පැමිණිය යුතු බවද සම්මුඛ පරීක්ෂණ අවස්ථාවෙන් පසුව කිසිදු හේතුවක් මත කිසිදු ලේඛනයක් සුදුසුකම් සනාථ කිරීම සඳහා භාර නොගන්නා බව ද තවදුරටත් අවධාරණය කරමි.